# සොබා රුව නසන හම සුදු වෙන රෝගයට පරිසරයෙන් පිළියම් ...



ඕ.ටී.එම්.ආර්.කේ.එස්.බී. කලවාන
ආයුර්වේද වෛද්‍ය
ඊ.ආර්.එච්.එස්.එස්. එදිරිවීර
ජ්‍යෙෂ්ට කථිකාචාර්ය
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,
කොළඹ විශ්ව විද්‍යාලය,
රාජගිරිය

**හැඳින්වීම**



සුදු කබර ලෙස හැඳින්වෙන චර්ම රෝගය ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන්නකි. ආයුර්වේදයේ මෙය විස්තර කර ඇත්තේ 'ශ්විත්‍ර' යන නමිනි. ඇලොපති වෛද්‍ය ක්‍රමයේදි 'vitiligo' ලෙස සුදු කබර රෝගය පිළිබඳව සඳහන් කර ඇත.

මෙහිදී ශරීරයේ එක් තැනක පමණක් හට ගත් කුඩා සුදු පැල්ලමක සිට මුළු ශරීරය පුරාම පැතුරුණු අවස්ථාව දක්වා ඇති විවිධ වයස් මට්ටම් වල සුදු කබර රෝගීන් දැක ගැනිමට පුලුවන. මෙම රෝග තත්වය මුහුණෙහි ඇස් වටා, නාසයෙහි, තොල්වල මෙන්ම ලිංගේන්ද්‍රය ඇතුලුව සමේ ඕනෑම තැනක විවිධ ප්‍රමාණ වලින් ඇතිවේ. ඇතැම් විට මේ මණ්ඩල ක්‍රමයෙන් විශාල වෙමින් පැතිරීම, කුඩා වීම හෝ නොවෙනස්ව එලෙසම පැවතීම ද දැකිය හැකිය. මෙම මණ්ඩල සුදු/ තඹ/ රෝස පැහැයට හුරු වන අතර ශ්‍රාව රහිතය. මණ්ඩල වියලි හා රළු ස්වභාවයක් දරන අතර ඇතම් විට සිනිඳු හා තෙල් සහිත ස්වාභාවයක් ද ඇත. දාහය හා කැසීම පිළිබඳව ද කළාතුරකින් රෝගින්ගෙන් පැමිණිලි ලැබේ. පැල්ලම් මත ඇති රෝම ද සුදු/ තඹ පැහැවීම හෝ හැලීයාම සිදු වේ. නමුත් මණ්ඩල ආශ්‍රිත සමෙහි සංවේදන විකෘතියක් සිදු නොවේ.

දැනට ලෝක ජනගහනයෙන් 0.5 -1 % දක්වා ප්‍රමාණයක් මෙම රෝගයෙන් පීඩා විඳින බව වාර්තා වී ඇත. ස්ත්‍රී/ පුරුෂ භේදයකින් හෝ වයස් භේදයකින් තොරව මෙම රෝගය හට ගනු ලැබුවත් , කළු හම සහිත ජාතීන් අතර මෙය සුලභ බව නිරීක්ෂණය කර ඇත. බොහෝ විට මෙය වැළඳෙනුයේ වයස අවුරුදු 20 ට පෙරදීය. ජානමය බලපෑමක් ද ඇතැම් විට තිබිය හැකි වුවත් බොහෝ රෝගීන්ට මේ සම්බන්ධව පවුල් ඉතිහාසයක් නොමැත.



පහත සඳහන් තොරතුරු එක් රැස් කර ගන්නා ලද්දේ දේශිය වෛද්‍යවරුන්ගෙන් අසා දැනගැනිම මගින් සහ දේශීය චිකිත්සාවට අදාලව ලියවුන විවිධ ග්‍රන්ථ හා පුස්කොළ පොත් වල තිබුණු ඖෂධ වට්ටෝරු අඩංගු කර පසුකාලීනව මුද්‍රණය කෙරුණු පොත් පත් රාශියක් පරිශීලනය කිරීම මගිනි .

**බාහිර ආලේප**



1. දිවි සම් දවාගත් අළු අබ තෙලින් ගෑම.
2. දිවි සම් දවාගත් අළු මී තෙලින් ගෑම.
3. දිවි ඇස් දවා ගත් අළු මී තෙලින් අඹරා ගෑම.
4. මොණර පිත ඉඟුරු සමඟ උණුවතුරෙන් අඹරා ගෑම - කට කබරයට විශේෂයි.
5. මොණර පිත එක්ව අඹරා ගත් මනෝසිල ගෑම.



6. මුව අං දළු දවාගත් අඟුරු කී කිරිඳිය සමඟ උක් පැණි, මී පැණි, කුරුම්බා ලෙලි ඉස්ම වලින් අඳුන් සමානව අඹරා ලප මතුපිට ගෑම.



7. ඉරිවේරිය දවාගත් අළු ඇල්දියෙන් අනා ගෑම. - කට කබරයට විශේෂයි.
8. ඇත් මදයෙන් යුක්ත වු පිච්ච වැල් දවාගත් අළු ගෑම.
9. පිච්ච කැකුළු අළු හස්ති මුත්‍රයෙන් ගෑම.



10. බෝධි ඇට පතක්, හිරියල් පලමක් ගෝ මුත්‍රයෙන් ගෑම.
11. නිල් උපුල්, සුවඳ කොට්ටම් , සවිඳ ලුණු ඇත් මුත්‍රයෙන් අඹරාගෑම.
12. කසා සුණු පස් කළඳකට ගෝ මුත්‍රා නැළියක් ලා කකාරා සිඳ ගෑම.
13. හිරියල්, දුම්මල, සතකුප්ප, වැල්මී, සෙන්කිරි කොට්ටන් සමව ගෙන මී පැණියෙන් අඹරා ගෑම.
14. සුදු හඳුන් , කටරොළු මුල්, තිප්පිලි මුල් ඇල්වතුරෙන් අඹරා ගෑම.





15. කොහොඹ, නෙල්ලි වියලා සුණු කර විසි කළඳක් ගෙන දී කිරි පෙරුණු දියවරින් අඹරා පෙරුම්කායම් මදක් ලාගෑම.
16. මකුළු ඇට, අමු කසා, පොල් යන තෙවගය වනේ ලා කොටා මිරිකා යුෂ ගෙන සිඳ ගෑම.
17. අරළු කොළ , වෙරළුකොළ , අවපක්ෂයේදි නෙලා කොටා උණු අළුවෙන් තම්බා යුෂ මිරිකා දිනකට කීප වරක් ගෑම.



18. සියඹලා පොතු , කොළ, ඇට, සමසේ ගෙන අඹරා ගෝ මුත්‍රයෙන් කකාරා පැණි සිඳ වියල් දුඹුළු වටා ගෑම.

19. නෙළුම් මල් ඉස්ම මනාවයි , තල තෙල් මනාවයි, ගෙන්දගම් එක් කලන් සමාරයි, මේ හැම එක්කර තුන් දවසක් මඳ ගින්නෙන් කකාරා ලණු වටෙන පදමට බාගෙන ගෑම.

20. තෝර ඇට , අමු කහ, තිත්ත කපුරු සහ කයිප්පු සමසේ ගෙන අඹරා වරා කිරි, එළඟි තෙල් සමඟ කලතා කකාරා ගෑම. - කට කබරයට විශේෂයි.
21. සමදරා කොල පොතු , ගැරඬි දුල් කොළ පොතු සමසේ ගෙන වෙඩි ලුණු , ගෙන්දගම් එක්කර පොල්කුඩු සමඟ කොටා දිනකට දෙතුන් වරක් ඇඟ උලා සවස බක්මී පොතු, පලටු පොතු, ඇඹුල් පොල් පිති, මදුරු කොල මෙකී දේ තම්බා ඒ දිය නානු.
22. හරන් කසා අල , පොල් දෙවගය වනේ ලා කොටා මිරිකා ලිප තබා දුරු පොඩි තබා තෙල් සිඳ ගෑම.
23. කොට දිඹුලා , ඇත්තෝර, කී කිරිඳිය, යුෂ සම ප්‍රමාණවත්ව පත එකක් ද , තල තෙල් පත තුන් කාලක් ද ගෙන කල්කයට සන්නිනායම් හා බෝධි ඇට කළඳ බැගින් දමා තෙල් සිඳ ගෑම.

**අභ්‍යන්තර ප්‍රයෝග කරන ඖෂධ :-**

01. වැල් මදට, ඇහැල, සඳුන් , හාතවාරිය, ඉරමුසු, රසකිඳ, කළාඳුරු, කොත්තමල්ලි, කොහොඹ, අරළු, බුළු, නෙල්ලි කෂාය සිඳ බීම.
02. තෝවැල්ල මුල් , දෙමට මුල්, ශම පත්‍ර කුඩාවට කපා පස් පස් කළඳ ගෙන දිය සතර නැළියක් කකාරා නැලියට සිඳ පෙරා ගෙන කැඳ පිස දී කිරි මෝරුවෙන් දීම

**සාකච්ඡාව :-**

මෙම වට්ටෝරු වල අමුද්‍රව්‍ය ලෙස ශාකමය හා සත්ත්වමය පදාර්ථයන් මෙන්ම පාර්ථිව මූල ද්‍රව්‍යයන් ද අඩංගු බව පෙනේ. විශේෂයෙන් දිවි සම් , දිවි ඇස්, මුව අං, මොණර පිත, ඇදිය භාවිතයට ගෙන ඇති අතර , ශාකමය හා පාර්ථිව කොටස් ඇඹිරීම සඳහා ගෝ මුත්‍ර , හස්ති මුත්‍ර , දී කිරි, මී පැණි බහුල වශයෙන් ප්‍රයෝජනයට ගෙන ඇත.
එමන්ම ඉතා සීමිත අමුද්‍රව්‍ය සංඛ්‍යාවක් යොදා ගනිමින් ඉතා පහසුවෙන් සාදා ගත හැකි සරල ඖෂධ වට්ටෝරු රැසක්ම මෙහි අඩංගු වන අතර ඉන් බොහොමයක්ම බාහිරව ප්‍රයෝග කල හැකි ඒවාය. ඒ අතර විවිධ අමද්‍රව්‍යය අඹරා සකස් කරන ආලේපන වර්ග , ඖෂධ කොටා මිරිකා ගනු ලබන යුෂ වර්ග, පැණි වර්ග, තෙල් වර්ග මෙන්ම ඇඟ අතුල්ලන බෙහෙතක් ද, ඇඟ සෝදන බෙහෙතක් ද , මෙහි සඳහන් වේ.
අභ්‍යන්තරව ප්‍රයෝග කිරීම සඳහා කෂායක් හා කැඳ වර්ගයක් සාදා ගන්නා අයුරු ද අඩංගුය.
වට්ටෝරු වල අඩංගු ඖෂධ වල ගුණ සලකා බැලීමේ දි ඉන් බොහොමයක ම තුන් දොස් සමනය කරන , ලෙය පිරිසිදු කරන , කුෂ්ට නාශනය කරන හා වර්ණය ඇති කල හැකි ගුණාංග පවතී.
එබැවින් මෙම ඖෂධ ප්‍රයෝග කිරීමෙන් සුදු කබර රෝගයට සාර්ථකව ප්‍රතිකාර කල හැකි බව පැහැදිලි වේ.

**ඔබේ අවධානයට :-**

සුදු කබර රෝගයට ප්‍රතිකාර ලෙස මුං ඇට, දිවි සම් ආදිය භාවිතා කල හැකි බව මෙහි දක්වා ඇත. නමුත් ඔබේ සුදුකබර රෝගය සුවකර ගැනීමේ අරමුණින් මෙම සතුන්ගේ ජීවිතය තොර කිරීම නම් කිසිසේත්ම නොකළ යුත්තකි. එම ඖෂධ සාදා ගැනීම සඳහා මිය ගිය සතුන්ගේ අං, සම් භාවිතා කළ හැකිය. එසේ නොමැතිනම් ශාකමය හා පාරථිව අමුද්‍රව්‍ය සහිත වට්ටෝරු රැසක්ම ඇති නිසා එයින් එකක් භාවිතා කළ හැකිය.එහිදීද සම්පූර්ණයෙන්ම ශාකය විනාශ නොකර අදාල කොටස පමණක් ප්‍රවේශමෙන් ඉවත් කර ගැනීමට වග බලා ගත යුතුය. ඔබේ පරිසරය රැක ගැනීම ඔබ සතු වගකීමක් වන බැවිනි.
තවද කිසියම් රෝගයක් සෑදී සුව කිරීමට වෙහෙසීමට වඩා එම රෝගයන් සෑදීම වලක්වා ගැනීමට වග බලා ගැනීම වැදගත් වේ. එනම් සුදු කබර රෝගය සෑදීමට එක් හේතුවක් ලෙස සැලකෙන මීයන් කැරපොත්තන් වැනි සතුන් බෝ නොවන පරිදි ඔබ අවට පරිසරය පිරිසිදුව තබා ගැනීමට සෑම විටම උත්සහ ගත යුතුය. එයින් පරිසරයත් ඔබත් යන දෙකම සුන්දර වේ.

**විමර්ශන :-**


1. තල්පතේ පිලියම් - 3, 9, 20 බාණ්ඩ , 1992, ප්‍රකාශනය - ආයුර්වේද දෙපාර්මේන්තුව.
2. රාජෞෂධ නිධිය හෙවත් පුරාණ රාජ වෙදුන්ගේ අත් පොත - පූර්වාර්ධය , 1933, ප්‍රකාශනය - ආයුර්වේද දෙපාර්තමේන්තුව
3. වෛද්‍යක හස්ත සාරය හෙවත් සිංහලේ අත් වෙද පොත, 2004, ප්‍රකාහනය - මොඩන් පොත් සමාගම
4. ශාස්ත්‍ර විශාරද සිසිර කුමාර ලියනාරච්චි, ගෘහ ඖෂධ චින්තාමිණි , 2003, ප්‍රකාශනය - අනුර ප්‍රිය ලියනාරච්චි
5. මංජුල රුවන් සිරිසේන, රහස්‍ය ඖෂධ ශතකය හෙවත් වෙදගැට සියය, 2003, ප්‍රකාශනය - එස්. ගොඩගේ සහ සහෝදරයෝ
6. දේවිකා ගුණසේන , සිංහල අනුවාදය, මොරෙෂ්වර පඬිතුමාගේ වෛද්‍යාමෘතය, 1987, ප්‍රකාශනය - මොඩන් පොත් සමාගම
7. වෛද්‍ය ඩී. ඩබ්. ප්‍රේමචන්ද්‍ර, යෝග කෞතුකය, 1934







